**වාවකච්චේරි ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශන සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාහන 06ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීමෙන් මෝටර් රථවල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි. | වාහන 06ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. | අදාල වාහනවල වටිනාකම මෙම වර්ෂයේදි මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 15 ක වටිනාකම ගිණුම්ගත නොකිරීමෙන් දේපළ වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි 15 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි 15 ක වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.4 අසම්භාව්‍ය බැරකම්**

2018 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|
| අවසර බලපත්‍රයක් නොමැතිව ජනතා මණ්ඩපයක් පැවැත්වීම සම්බන්ධයෙන් සභාව විසින් අධිකරණයේ 2018 ජූලි 28 දින අංක 24531 යටතේ නඩුවක් පවරා විභාග වෙමින් පැවැතිම නිරීක්ෂණය වූ අතර මේ සඳහා වූ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස දක්වා ඇත. |

**1.5 අනුකූල නොවීම**

**1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත158(1) වගන්තිය | රු.427,070 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට එරෙහිව සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | නියමිත පනත් උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ හිඟ මුදල් අයකරනු ලබන අතර වරෙන්තු නිවේදනද නිකුත් කෙරේ. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය අමුණනු ලැබේ. |

| | | |
|---|---|---|
| | ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | |

**1.5.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

---

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වේ. | ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා සමග සාකච්ඡා කිරීමෙන් නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 32,663,917 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 55, 767,504 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 106,000 | - | 24,731 | 484,156 | 106,000 | - | 86,145 | 611,440 |
| කුලී | 13,679,907 | - | 14,903,808 | 113,004 | 14,930,100 | - | 14,385,089 | 165,204 |
| බලපත්‍ර ගාස්තු | 739,050 | - | 1,950,111 | 5,850 | 1,401,650 | - | 983,870 | 5,850 |
| වෙනත් ආදායම් | 74,467,943 | - | 71,580,661 | - | 66,515,337 | - | 87,051,146 | 6,445 |
| එකතුව | 88,992,900 | - | 88,459,311 | 603,010 | 82,953,087 | - | 102,506,250 | 788,939 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු. 102,506,250 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.88,459,311 ක් වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.14,046,939 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවත්, ආදායම් බිල් කිරීමට අපොහොසත් විමෙන් අදාළ හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | දේපළ බදු ආදායම් බිල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ දේපල බදු රු.337,581 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.5,882,717 ක් ලැබිය යුතුව තිබුණි. | සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලුම කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් හා සුහසාධන සහ ආරක්‍ෂා කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 09ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | මූලික කරුණු 30 සඳහාම අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වේ. | අනෙකුත් විෂයයන් සඳහා අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ උප රීතීන් ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 06ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 563,794ක් වැයකර තිබුණත් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | ආදායම් වැඩිකර ගැනීමටත් වියදම් අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | කසල කාබනික පොහොර බවට පත්කිරීමෙන් සභාවට ආදායම් නොලැබේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය රාජකාරීයේ යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණ සභාව විසින් සිදු කර නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් නිවැරදි ආකාරයෙන් සිදුකළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීමට කටයුතු කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ගිණුම්වල ඇති රු.76,855,377 ක් නගර සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | නිෂ්චිත අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වේ. | ප්‍රතිපාදනය කළ වටිනාකමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ස්ථාවර තැන්පතු පොලී සහා ආදායම් ලෙස උපයෝජනය කෙරේ. |
| (ආ) | සභාවේ අනුමැතියකින් තොරව ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 08ක් සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලබා ලැනීමට සහ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කෙරේ. |
| (ඇ) | පසුගිය වසර 10කට අධික කාලයක සිට සභාව විසින් වරිපනම් හා බදු අයකිරීම සඳහා වූ දේපළ යළි ඇගයීම් සිදුකර නොතිබුණි. | දේපළ යළි ඇගයීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | දේපළ යළි ඇගයීම් කිරීමට කටයුතු කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නගර සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | ජනතාවට නියමිත කාලයේදී සේවාවන් සැලසිය යුතු වේ. | මහජන සේවා ලැයිස්තුව හඳුන්වා දීමට කටයුතු කෙරේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 16 ක් විසින් නිමකළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | අනුමත තනතුරු සංඛ්‍යාවට සමාන සේවක සංඛ්‍යාවක් බඳවා ගත යුතුවේ. | තනතුරු පුරප්පාඩු නැති කිරීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල සඳහා "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | "K" ආකෘති පත්‍ර නියමිත කාලයේ නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක් සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහන 03හි අයිතිය මාරු කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවති. |

### 3.5.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ වාහන 03ක් අදාල අවශ්‍යතාවයන්ට වර්ෂ 2 සිට වර්ෂ 9ක් දක්වා භාවිතා කර නොතිබුණි. | වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | භාවිතා කළ නොහැකි තත්ත්වයේ වාහන වෙන්දේසි කිරීමටත්, අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමටත් කටයුතු කරනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් සැසඳීමේදි රු.16,661,025කින් හිතකර ලෙස බලපා තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දි නොතිබුණි. |
| (ආ) | සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් වන ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා, සහනාධාර, උපකාරක මුදල්, විශ්‍රාම වැටුප් වැනි වියදම් තථ්‍ය වටිනාකමින් වැඩි ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි.මේ නිසා අයවැය එක් ඵලදායි පාලන කාරකයක් ලෙස සැලකිය නොහැකි විය. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාල වියදම් පසුගිය වර්ෂයට වඩා මෙම වර්ෂයේ අනපේක්ෂිත ලෙස අඩුවීමෙන් මෙම ඉතිරිවීම් සිදු වී තිබුණි. |